**දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල - 2022**

**-----------------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා පරිචයන්ට පටහැනිව ගනුදෙනු පිටපත් කිරීමේදී අපැහැදිලි හා විධිමත් නොවන ලෙස ප්‍රධාන ලෙජරය හා ගිණුම් පොත් පවත්වා තිබූ අතර ගනුදෙනු වලට අදාල වවුචර් අංක, චෙක්පත් අංක යනාදී විස්තර මකා දමා වෙනස් කිරීම් සිදුකර විනිවිදභාවයකින් තොරව මුදල් පොත සහ වියදම් ලේඛන පවත්වා තිබුණි. | මේ වන විට එම දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර ඇත | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා පරිචයන්ට අනුව කටයුතු කල යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව උපචිත පදනම මත ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලට අදාලව රු. 52,362 ක්වූ පොලී ආදායම ගිණුම් ගත කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාල අවසන් ගිණුම් සැකසීමේදී එම පොලී ආදායම ගැලපීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 958,571 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.275,050 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.683,521 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අධ්‍යාපනය හා සංස්කෘතියට සහය දීමේ වියදම් රු.1,746,969 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල සඳහා රජයේ ප්‍රතිපාදන වලට අමතරව , දේශීයව හෝ විදේශ වලින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග, උපලබ්ධි හෝ එකතු කරන මුදල් සහ අරමුදලේ ආයෝජනවලින් ලැබෙන ආදායම හෝ අරමුදලට අයවිය යුතු හෝ වෙනත් මුදල් මඟින් අරමුදල් සම්පාදනය කර ගැනීමට 1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 7 වගන්තිය පරිදි නෛතික ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් අරමුදල ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 29 ක කාලපරිච්ඡේදය තුල අරමුදල වර්ධනය කරගැනීම වෙනුවෙන් රජයේ ප්‍රදාන වලට අමතරව අනෙකුත් අරමුදල් ප්‍රභවයන් කෙරෙහි අවධානය යොමුකර හෝ ඒ සඳහා ඉදිරි සැලැස්මක් හෝ අරමුදල සතුව නොතිබුණි. | අරමුදල සඳහා ආදායම් උත්පාදන කටයුතු වෙනුවෙන් සීදූව වෘත්තීය පුහුණු ආයතනය තුළ පවත්වාගෙන ගිය දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානයේ අත්යන්ත්‍ර පේෂකර්ම අංශය අලාභ ලබන තත්වයක් තුළ වසා දැමීමට කටයුතු කරන ලදි. 2023 වර්ෂයේ මුදල් රැස්කිරීමේ අරමුණින් කැට ස්ථාපනය කිරීමේ වැඩ සටහනක්ද මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී. | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදල් සම්පාදනය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | අරමුදලේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ<br>➢ දෘශ්‍යාබාධයින් උදෙසා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම. | ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය මගින් දෘශ්‍යාබාධිතයින් ඇතුළු සියලු ආබාධිත තැනැත්තන් වෙනුවෙන් ස්වයංරැකියා ආධාර ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බැවින් අරමුදල මගින් ස්වයංරැකියා ආධාර ලබා දීමේ වැඩ සටහන නවතා දැමීමට කටයුතු කර ඇත.එසේ වුවද පවත්වාගෙන ගිය ස්වයංරැකියාව සඳහා බාධා ඇතිවූ දෘශ්‍යාබාධිත පුද්ගලයින් 20 දෙනෙකු සඳහා | අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | විශේෂ අවස්ථාවක් ලෙස සලකා ස්වයංරැකියා ආධාර ලබා දීමට කටයුතු කරන ලදි. | |
| ➢ දෘශ්‍යාබාධිතයින්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීම හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස නිවාස පහසුකම් සැපයීම. | සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තුළින් ඔවුන් සඳහා නොමිලේ නේවාසික පහසුකම් සපයා දෙන බැවින් වර්තමානය වන විට එවැනි අවශ්‍යතාවයක් මතුව නැත. | අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට කටයුතු කල යුතුය. |
| ➢ දෘශ්‍යාබාධයින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම. | දෘශ්‍යාබාධිත පුද්ගලයින් විසින් නිෂ්පාදන කටයුතුවල නිරත වනුයේ ප්‍රාදේශීය මට්ටමින් සුළු ප්‍රමාණයෙන්ය. ඒ සඳහා ඔවුන් විසින් හඳුනාගත් වෙළඳපොලක් අනුව අලෙවි කටයුතු සිදුකරනු ලබයි. බොහෝ දෘශ්‍යාබාධිත තැනැත්තන් විසින් සිදු කරනුයේ සාමාන්‍ය වෙළඳපොල තුළින් සුළු පරිමාණ තොග මිලදී ගෙන අලෙවි කිරීමයි. | අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට කටයුතු කල යුතුය. |
| ➢ සමාන අයිතිවාසිකම් හා සමාන අවස්ථා ලබාගැනීමෙන් වළක්වාලන තත්ත්වයන් නැතිකිරීම යනාදී කාර්යයන් සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම්කර ක්‍රියාත්මක කර නොතිබුණි | දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන සෑම වැඩසටහනක් තුළින්ම දෘශ්‍යාබාධිත තැනැත්තන්ගේ සමාන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ක්‍රියාත්මක කරනු ලබයි. | අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට කටයුතු කල යුතුය. |

(ඇ) පළමු වසරේ සිට අ.පො.ස.(සා.පෙළ) දක්වා ඉගෙනුම ලබන දරුවන්, උසස් පෙළ හදාරන දරුවන්, විශ්ව විද්‍යාලීය දරුවන් සහ ලුවී බ්‍රේල් නමින් දෘශ්‍යාබාධිත දෙමව්පියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන්ට අධ්‍යාපන ආධාර වශයෙන් ශිෂ්‍යාධාර ලබාදීම අරමුදල මඟින් සිදුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ඉලක්ක ගත 401 දෙනෙකු ගෙන් සිසුන් 368 දෙනෙකුට ශිෂ්‍යාධාර ලබාදීම සඳහා රු.5,279,586 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකල නියදි පරීක්ෂාවේ දී පහත කරුනු නිරීකෂණය විය.

| | | | |
|---|---|---|---|
| I. | සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි දෘශ්‍යාබාධිත දරුවන් සංඛ්‍යාව හඳුනාගැනීමට අදාලව දත්ත පද්ධතියක් පවත්වා නොතිබුණි. | අවශ්‍ය මූල්‍ය, භෞතික සහ මානව සම්පත් අරමුදල සතුව නොපවතී. දත්ත පද්ධතියක් සඳහා තොරතුරු රැස් කිරීමේදී ඒ සඳහා සමීක්ෂණ නිලධාරීන් විශේෂයෙන් පුහුණු කළ යුතුය. එවැනි කාර්යයක් සාර්ථකව සිදුකිරීම සම්පත් සීමිත වීම තුළ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලට අපහසු කාර්යයකි. | දෘශ්‍යාබාධිත ප්‍රජාව හඳුනාගැනීමට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |
| II. | ශිෂ්‍යාධාර ලබාදීමට අදාලව ශිෂ්‍යයින් තෝරා ගැනීමේ පදනම, අවශ්‍ය සුදුසුකම්, ප්‍රමුඛතාවය ලබාදීම, ලබාදෙන ශිෂ්‍යාධාර වටිනාකම යනාදී නිර්ණායක ඇතුලත් ශිෂ්‍යාධාර ලබාදීමේ යෝජනා ක්‍රමයක් සැලසුම්කර ක්‍රියාත්මක කර නොතිබුණි. | ශිෂ්‍යාධාර ලබා දීමේ පදනම වනුයේ දෘශ්‍යාබාධිත තැනැත්තෙක් වීම, දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ දැස් පෙනෙන අඩු ආදායම්ලාභී දරුවකු වීමය. ලබා දෙන ශිෂ්‍යාධාර වටිනාකම කලින් කලට දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි. | ශිෂ්‍යාධාර ලබා දීමේ විධිමත් නිර්ණායක හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |
| III. | ශිෂ්‍යාධාරලාභීන් තෝරාගත් ක්‍රමවේදය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම කටයුතු නිවැරදිව හා විනිවිදභාවයකින් යුතුව සිදු කර තිබුණේ ද යන්න විගණනයේදී ගැටළු සහගත විය. | 2022 වර්ෂය දක්වා දෘශ්‍යාබාධිත බව සනාථ වන අඩු ආදායම්ලාභී සියලුම ඉල්ලුම්කරුවන් වෙත ශිෂ්‍යාධාර ලබා දීමට අරමුදල විසින් කටයුතු කර ඇත. ඒ හේතුවෙන් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ ගැටළුවක් මතු නොවිණි. | විගණනයට තහවුරු කරගැනීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කිරීමට කටුයුතු කල යුතුය. |
| IV. | මාර්තු සහ අප්‍රේල් මස ශිෂ්‍යාධාරලාභීන් 158 දෙනෙකු වෙත රු.735,000 ක ශිෂ්‍යාධාර ලබා දී තිබූ අතර ශිෂ්‍යාධාරලාභීන් 115 දෙනකු ලබා ගත් රු.507,000 මුදල සනාථ කිරිම සඳහා ලදුපත් අරමුදල වෙත ලබා දී නොතිබුණි. ඒ අනුව ශිෂ්‍යාධාර ලබාදීමේ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර පාලනය දුර්වල තත්ත්වයක පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ සිට එම දෝෂ නිවැරදි කර ඇත. | විගණනයට තහවුරු කරගැනීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කිරීමට කටුයුතු කල යුතුය. |
| (ඇ) | දෘශ්‍යාබාධිත දක්ෂ දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය දිරිමත් කිරීමේ අරමුණින් පහ වසර ශිෂ්‍යත්වය සමත් දෘශ්‍යාබාධිත | දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ සියලු ශිෂ්‍යාධාර වැඩසටහන් එකවර ආරම්භ වී | 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සමත් දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීමේ වැඩ |

| | | | |
|---|---|---|---|
| | ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීමේ වැඩපිළිවෙලක් කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | ක්‍රියාත්මක වී නොමැත. එය කාලීන අවශ්‍යතාවය පරිදි ක්‍රමිකව වර්ධනය වූවක් වේ. | පිළිවෙලක් සැකසිය යුතුය. |
| (ඉ) | දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ පුනරුත්ථාපනය හා සුභසාධනය උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවකින් හා විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය, වයස් ව්‍යුහය, දෘශ්‍යාබාධිත තත්ත්වය, ආර්ථික තත්ත්වය යන තොරතුරු හඳුනාගැනීම වැදගත් වේ. ඒ තුලින් නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා පහසුවක් වේ. නමුත් දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ එම තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | දෘශ්‍යාබාධිත පුද්ගලයින් ඇතුළු සියළුම ආබාධිතයින් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීමට සමාජ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටී. දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ කාර්යයන් සඳහා එම දත්ත හා තොරතුරු පදනම් කර ගනිමින් කටයුතු කිරීමට අපේක්ෂා කරමි | දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් සකස් කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ කාර්යයන් සිදු කිරීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් අනුමත කර නොගැනීම, ඊට අනුකූලව බඳවාගැනීමේ පටිපාටිය සකස් කර නොගැනීම, බඳවාගැනීම් පටිපාටිය අනුව බඳවා ගැනීම් සිදු නොකිරීම තුලින් අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ කාර්යයභාරයන් ඉටුකිරීම හා එමගින් අපේක්ෂිත කාර්යසාධනයක් පැවැත්වීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | අරමුදලේ මූල්‍ය තත්වය වර්ධනය කර ගැනීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ අවධානය යොමු වී ඇති අතර එසේ වුවහොත් අවශ්‍ය බඳවා ගැනීමේ පටිපාටි සකස් කර අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට අපේක්ෂා කරමි. | කාර්යභාරය ඉටු කර ගැනීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට පියවර ගත යුතුය. |